**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 16/2017**

මගේ අංකය NP/07/10/02/107
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
2017.07.20

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරතුමාගේ ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන් ,
නියෝජ්‍ය ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රුයදුරු සේවයේ III, II හා Iවැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (II) (2017)**

2014.08.15 දිනැති හා අංක 1875/39 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවයේ මෝටර් රථ වාහන රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව පිළියල කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ 9 වන ඡේදය හා 14 වන ඡේදයෙ හි සඳහන් විධිවිධාන, අන්තර්කාලීන විධිවිධාන හා ඇමුණුම් 02, 03 හා 04 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III, II හා Iවැනි ශෙ‍්‍රණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් **2017 සැප්තැම්බර් මස** පැවැත්වීමට නියමිත බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගය යාපනය හා වවුනියාව යන නගර වල පැවැත් වේ. එම නගර වලට අදාළ නගර අංක පහත දැක්වේ, මෙහිදී ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් හෝ වෙනත් හේතූන් මත විභාග මධ්‍යස්ථානය වෙනස් කිරීමට සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් තිරණ ගැනිමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා සතු වේ. අයදුම් කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍රයේ සඳහන් වූ නගරය පසුව මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 03 |

3.0 **සුදුසුකම්:-** තනතුරට ආදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රකාර එම සේවයේ ආදාළ පන්තියට පත්වීම් ලබා ගත්/උසස් වීම් ලැබූ නිලධාරීන් හා මේ දක්වා මෙම විභාගයට පෙනී සිට සමත් නොවූ නිලධාරීන්ද මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

4.0 ඉල්ලුම්පත්‍රය මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර අපේක්ෂකයින් විසින් තම අයදුම්පත්‍රය සකස් කරගත යුතු අතර, ඒ අනුව සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2017.08.16** වන දිනට හෝ ර්ට ප්‍රථම ලැබෙනසේ **ලේකම්,පළාත් රාජය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සපයා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව:-** අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.( pass port )

ඉහත සඳහන් ලියවිල්ලිවලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපහොසත් වන අයදුම්කරුවෙකුගේ අනන්‍යතාව අවලංගු කිරීමේ බලය නිරීක්ෂක සතුය.

6.0 **අයදුම්පත්‍රය :-** අංක 1 සිට 6 දක්වා ඡේදයන් පළමුවන පිටුවටද අනෙක් කරුණු දෙවන පිටුවේද ඇතුළත් වන පරිදි 'ඒ 4' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අයදුම්පත්‍රය පරිගණක යතුරු ලියනය මගින් සකස් කර එය නිවැරදිව හා පැහැදිලිව තම අත් අකුරුවලින් පුරවා යොමු කළ යුතුයි. අයදුම්පත සකස් කිරීමේ දී මේ සමඟ අමුණා ඇති ආකෘතිය පරිදි ම සකස් කර ගත යුතු අතර, සකස් කරන ලද අයදුම්පත්‍රයේ ජායාපිටපතක් හෝ වෙනත් පිටපත් භාර ගනු නොලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට නොගැළපෙන හා අසම්පූර්ණ තොරතුරු සපයන ලද අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද විභාග කොන්දෙසි වල සඳහන් වූ පරිදි හා ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාර තම අයදුම්පත සකස් කර ගැනීම සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ අවධානය යොමුවිය යුතු අතර එහි පිටපතක් තමන් ලග තබා ගැනිම අත්‍යාවශ්‍ය වේ.

7.0 **විභාග ගාස්තුවඵ'**

7.1 පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ගාස්තුව කිසිවක් ගෙවීමට අවශ්‍ය නොවේ. එසේ වුවද ඉන්පසු වාරවල දි නිලධාරියෙක් විභාගයට පෙනි සිටි නම් රු 200.00 වටිනා මුදල් ඇණවුමක් උතුරු පළාතේ ඇති ඕනෑම තැපැල් කාර්යාලයකින්, **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාගේ නමට හා යාපනය මධ්‍යම තැපැල් කාර්යාලයේදි මාරු කරගත හැකි වන පරිදි** ලබාගත් මුදල් ඇණවුම අයදුම්පත්‍ර සමග එවිය යුතුය. එම මුදල් ඇණවුමේ ජායා පිටපතක් තමන් ලග තබා ගැනිම ප්‍රයෝජනවත්වනු ඇත.

7.2 කුමන හේතුවක් නිසාවත් මෙම ගාස්තු නැවත ගෙවනු ලබන්නේ නැත එම ගාස්තු වෙන විභාගයක් සඳහා යොදාගත නොහැකි බවත් දන්වා සිටිමි.

8.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින්ට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලේකම් විසින් යථා කාලයේදී ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබයි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු එම අපේකෂකයා විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට සනාථ කිරීමක් නොවන බව සැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට අවස්ථාව දෙනු නොලැබේ. යම් අපේකෂකයකුට අවම වශයෙන් විභාගයට දින 03 කට ප්‍රථම ප්‍රවේශපත්‍ර ලැබුණේ නැතිනම් ඔහු විසින් එම තොරතුරු **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාට** පහත සඳහන් විස්තර සමඟ දන්වා සිටිය යුතුය.

(i) ඉල්ලුම්කල ලිපිය

(ii) ඉල්ලුම්පත්‍රයේ පිටපත

(iii) මුදල් ඇණවුමේ සහතික කල පිටපත

(iv) ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකය (Fax No)

(v) අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා දිනය

9.0 මෙම විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබී ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමේ පහසුව සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු අනුමත කළ යුතුය. ප්‍රවාහන ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 මෙම විභාගය සඳහා පෙනි සිටින අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 11.0 **විභාග පරිපාටීන්** :

11.1 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

1.**විෂය නිර්දේශය:-**

| **විෂය ක්ෂේත්‍රය** | **විෂය නිර්දේශය** |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1. මහාමාර්ග හා මාර්ග නීති සම්බන්ධ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබේ.<br>1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම<br><br>2. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, සන්නිවේදන මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>* මෝටර් රථ රියදුරන්ගේ රාජකාරී සහ වගකීම<br>* රජයේ වාහන නඩත්තුව හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරුගේ වගකීම<br>* දෛනික ධාවන සටහන<br>* වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>* වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>* රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග |

2.**ලකුණු ලබා දීමේ ක්‍රමය:**

| **විෂය ක්ෂේත්‍රය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු** |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 50 | 20 |
| වාචික පරීක්ෂණය | 50 | 20 |
| මුළු ලකුණු ප්‍රමාණය | 100 | 40 |

❖ වාචික හා ප්‍රායෝගික විභාග දෙකම එකවරකදී සමත්විය යුතුයි

11.2 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ II වැනි ශ්‍රේණියට අයත් නිලධාරීන් සඳහා දෙවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් පහත සඳහන් විෂයයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් පරීක්ෂා කරනු ලැබේ.

1. **විෂය නිර්දේශය:-**

| **විෂය ක්ෂේත්‍රය** | **විෂය නිර්දේශය** |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br><br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍රය තුළ ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෝෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇද්ද යන්න මැන බැලීම. |

2. **ලකුණු ප්‍රදානය කිරීමේ ක්‍රමය:-**

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50<br>50 | 20<br>20 |
| මුළු ලකුණු ප්‍රමාණය | 100 | 40 |

❖ ප්‍රවීනාතාවයන් දෙකම එකවර සමත්විය යුතුයි

11.3 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ I වැනි ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන තුන් වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පහත සඳහන් කරුණු සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින් පරීක්ෂා කරනු ලැබේ.

1. **විෂය නිර්දේශය:-**

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඟ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැළපෙන පරිදි මනා ලෙස වර්ධනය වී තිබේද යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගෙන ඇත්ද යන්න මැන බැලීම සිදු කෙරේ. |

2.**ලකුණු ප්‍රදානය කිරීමේ ක්‍රමය**

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50<br>50 | 20<br>20 |
| එකතුව | 100 | 40 |

❖ ප්‍රවීනතාවයන් දෙකම එකවර සමත් විය යුතුයි.

12.0 මෙම චක්‍රලේඛයේ සඳහන්ව කරුණු ඔබේ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ කාර්යාලවල සේවය කරන අදාළ නිලධාරින්ට දනුම් දෙනලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. එමෙන්ම මෙම තොරතුරු උතුරු පළාත් www.np.gov.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

**සටහන:-** මෙම විභාග දැන්වීමට ඇතුලත් කර නොමැති යම් විෂයක් සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාගේ තිරණය අවසන් තිරණය වේ. එමෙන්ම දෙමළ මාධ්‍යයේ හෝ සිංහල මාධ්‍යයේ යම් කිසි වෙනසක් හඳුනාගත හොත් දෙමළ භාෂාවෙන් සඳහන් නිවේදනය නිවැරදි නිවේදනය බව පිළිගත යුතුයි.

**සී. ඒ. මෝහන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
2017.07.20

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

***ආදර්ශ අයදුම්පත්‍රය***

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III, II හා Iවැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (II) (2017)**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐

සිංහල -S, දෙමළ-T

(අදාළ අකුරක් කොටුව තුළ ලියන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| | |

(දැන්වීමේ 02 වන පන්තියේ සඳහන් වූ පරිදි ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න)

1.

1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :- Mr/Mrs/Miss

……………………………………………………………………………………………

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : Mr.M.A.SILVA

1.2 මුලකුරු සමග නම:-මයා/මිය/මෙනෙවිය ……………………………………………………………………

(සිංහලෙන්/දෙමළෙන්)

1.3 සම්පූර්ණ :-…………………………………………………………..

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 සම්පූර්ණ නම :-…………………………………………………………..

(සිංහලෙන්/දෙමළෙන්)

2.සේවා ස්ථානය හා ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර යොමු කරනු ලැබේ)

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

2.2 සිංහලෙන්/දෙමළෙන්

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

2.3 දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

පුරුෂ -0

ස්ත්‍රී -1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

5.ඔබ අයත් වන ශ්‍රේණිය ( අදාළ ශ්‍රේණිය ඉදිරියෙන් "X" ලකුණ යොදන්න)

01 ශ්‍රේණිය III ☐

02 ශ්‍රේණිය II ☐

03 ශ්‍රේණිය I ☐

6. දැනට දරන තනතුර :

6.1 තනතුර හා පන්තිය :- ……………………………………………………………………..

6.2 පත්වීම් ලිපියේ අංකය :-……………………………………………………………………

6.3 ආදාළ පන්තියේ පත්වීම්/ උසස්වීම් ලැබූ දිනය:……………………………………………

7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ? :-……………………………………………..
(7.1 ඡේදයට අදාළ තොරතුරු නත්නම්)
7.2 **නැතිනම්** මුදල් ගෙවූ මුදල් අණවුම් අංකය:- ………………………………………………
7.3 මුදල් අණවුම ලබා ගත් තැපැල් කාර්යාලය :- ……………………………………………

**මුදල් ඇණවුම නොගැලවෙන සේ මෙහි අලවන්න**

ඉහත සඳහන් කරුණු නිවරදි බවත්, දෙමළ/සිංහල භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බවත්, මම විභාගයට ……… වරට පෙනී සිටින බවත්,විභාග ගාස්තුවක් ගෙවීමේ අවශ්‍යතාවය නැති බවත්/විභාග ගාස්තු වන රුපියල්……………… වටිනාකමක් ඇති විභාග ගාස්තු……………………තැපැල් කාර්යාලයේ …………………… වැනි අංක දරණ ……………………වැනි දිනැති මුදල් ඇණවුම මගින් යොමු කරන බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ තීරණයට හා පනවනු ලබන නීතිරීතිවලටද යටත් වන බවද මෙයින් ප්‍රකාශ කරමි.

……………………..
දිනය……………………        අපේක්ෂකයාගේ අත්සන

සටහන.-තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් තැබීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

…………………………මහතා/මහත්මිය/මෙනෙවිය මෙම කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරියෙකු බවත් මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත් ………………………වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙම නිලධාරියා විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන බැවින් විභාග ගාස්තු ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැකි බවත්/ විභාග ගාස්තු ගෙවා ඇති බවත් අදාළ මුදල් අණවුම මේ සමග අමුණා ඇති බවත් සහතික කරමි.

………………………..
සහතික කරන්නාගේ අත්සන සහ
නිල මුද්‍රාව

නම :-………………………………………………
පදවි නාමය :-…………………………………………...
ලිපිනය:-…………………………………………
දිනය :-…………………………………………….

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(ii) මෙම නිලධාරියා ඒකාබද්ධ සේවාවට අයත් රියදුරෙක් බවත්
(iii) මෙම නිලධාරියා අදාළ විභාගයට මීට ප්‍රථම පෙනී සිටිය/නොසිටිය බවත්,
(iv) මෙම නිලධාරියා මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටිය බැවින් නියමිත වටිනාකමින් යුත් මුදල් ඇණවුම ඉල්ලුම්පත්‍රයට අමුණා ඇති බවත්,
(v) මෙම නිලධාරියා මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,මම සහතික කරමි.

…………………………..
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ
නිල මුද්‍රාව.

නම :-…………………………………………….
තනතුර :-……………………………………….
ලිපිනය:-…………………………………………..
දිනය :-……………………………...………..

* අනවශ්‍ය දෑ කපා හරින්න.

ඉහත ඉල්ලුම් කර ඇති කරුණු සම්පූර්ණ කිරීමකින් තොරව හෝ වැරදිසහගත ලෙස හෝ අවධානයට ලක්වුවහොත් අයදුම්කරුගේ තොරතුරු සනාථ කරන නිලධාරියා හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මෙයට වගකිව යුතුවේ,